# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාර්ත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය

බදු හා වරිපනම් ගාස්තු, විදුලිය, ජල ගාස්තු, රක්ෂණ, උපකරණ නඩත්තු, සාමාන්‍ය නඩත්තු, ගොඩනැගිලි නඩත්තු හා ක්ෂයවීම් යනාද වූ පොදුකාර්ය පිරිවැයවලන් සයයට 90 ක් නිෂ්පාදන පිරිවැය ලෙසද, ඉතිරි සයයට 10 පරිපාලන වියදම් ලෙසද අනතර්ග්‍රහණය කරීම සංස්ථාවේ ප්‍රතිපත්තිය වේ.
පහත සඳහන් නිරීක්ෂණයන් කරන ලැබේ.

(අ) සංස්ථාවේ ගොඩනැගිලි වලින් සයයට 70 ක පමණ ප්‍රමාණයක් නිෂ්පාදන අංශය සඳහා උපයොජනයකර තිබුණද, රු.31,105,624ක්වූ ගොඩනැගිලි ක්ෂයවලින් සයයට 90කට සමාන අගයක් වූ රු.27,995,061ක් නිෂ්පාදන පිරිවැයට අන්තර්ග්‍රහණය කර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස දළ වශයෙන් රු.6,221,124 ක ක්ෂය, නිෂ්පාදන පිරිවැයෙහි වැඩියෙන් ඇතුළත්ව තිබුණි.

(ආ) සමාලොචිත වර්ෂයට අදාළ ලීබඩු සවිකිරීම් ක්ෂයවලින් සයයට 32ක්ද, උපකරණ ක්ෂයවලින් සයයට 11කද, පරිඝණක උපාංග ක්ෂයවලින් සයයට 12 ක්ද වශයෙන් එකතුව රු. 3,089,303 කවූ ක්ෂය නිෂ්පාදන පිරිවැයට අන්තර්ග්‍රහණය කළ යුතු වුවද, ලීබඩු සවිකිරීම්, උපකරණ හා පරිඝණක උපාංග ක්ෂයවලින් සයයට 90කට සමාන අගයක් වූ රු. 21,866,469 ක් නිෂ්පාදන පිරිවැයට අන්තර්ග්‍රහණය කර තිබුණි. මෙහ ප්‍රතිඵලයක් ලෙස ලීබඩු සවිකිරීම්, උපකරණ හා පරිඝණක උපාංග සඳහා වූ ක්ෂය එකතුව රු. 18,777,166 ක් නිෂ්පාදන පිරිවැයෙහි වැඩියෙන් ඇතුළත්ව තිබුණි.

1.2.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම.

වෙළඳ හා වෙනත් ගෙවිය යුතුදෑ යටතේ ඇතුළත් පෞද්ගලික ආයතන 86 කට ගෙවිය යුතු රු.55,159,247 කින් ආයතන 72 කට ගෙවිය යුතු රු. 52,837,397 ක් සම්බන්ධයෙන් තහවුරු කිරීම් නොලැබුණි.

1.2.3 නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකල නොවීම |
|---|---|
| (අ) 2009 මාර්තු 09 දිනැති අංක ඩීඑම්එස්/ඊ4/10/4/090/2 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සෞඛ්‍ය ලේකම්වරයා අමතා තබණ ලිපිය | |
| (i) ඡේද අංක 02-01 | විධායක හා විධායක නොවන සැම සේවකයකුටම දුර ප්‍රමාණය පදනම්කර ප්‍රවාහන දීමනා ගෙවනවා වෙනවට ඔවන් වෙත පිළිවෙලින් මාසිකව රු. 4,700 ක හා රු. 3,000 ක බැගින් සථිර ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. |
| (ii) ඡේද අංක 02-01 (1) | සංස්ථාව විසින් කණඩායම් ප්‍රවාහන පහසුකම් සපයා තිබුණ මාර්ග සමීපයෙ පදංචි සේවකයින්ටත් ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි. |
| (iii) ඡේද අංක 02 -02 | මසකට රු.4,000 බැගින් ගෙවිය හැකි උපරම නිෂ්පාදන දිරි දීමනා මුදල රු. 9,600,000ක් වුවද, එ වෙනවට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව 2011 ජූලි 01 දින සිට මසකට රු. 12,000 බැගින් 200 දෙනෙකව සමසථ කාර්ය මණ්ඩලය වෙත රු.19,300,515 ක් ගෙවා තබීම හෙතවෙන වැඩියෙන් ගෙවා තිබුණ නිෂ්පාදන දිරි දීමනා මදල දළ වශයෙන් රු. 9,700,515 ක් විය. |

| | | |
|---|---|---|
| (ආ) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ | |
| (i) | 1998 මාර්තු 18 දිනැති අංක පීඊඩී 13 දරන චක්‍රලේඛය. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සේවක ණය පොලී අනුපාතය සියයට 7 සිට සියයට 4.2 දක්වා අඩුකර ණය පොලී අයකර ගෙන තිබීම හේතුවෙන අඩුවෙන් අයකර තිබූ ණය පොලී ආදායම දළ වශයෙන් රු. 1,110,450ක වී තිබුණි. |
| (ii) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන චක්‍රලේඛය. | |
| | ඡේද අංක 6.5.2 | වාර්ෂික වාර්තාව ගිණම් වර්ෂය අවසන්වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2011 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2013 මාර්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |
| | ඡේද අංක 6.5 | කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) | 2011 පෙබරවාර 11 දිනැති අංක පීඊඩී 57 දරන චක්‍රලේඛය. | රාජ්‍ය නොවන ආයතනයකට හෝ රාජ්‍ය සංවර්ධන ව්‍යාපෘතියක නොවන අංශ වෙත සිදු කරනු ලබන රු.100,000 ඉක්මවූ ප්‍රදානයන් හා අනුග්‍රාහකත්ව දීමනාවන් සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් ඊට පටහැනිව අවස්ථා 09 කදී ප්‍රදානයන් හා අනුග්‍රාහකත්ව දීමනා ලෙස රු.2,398,512ක් ගෙවා තිබුණි |

| | | |
|---|---|---|
| (iv) | 2011 සැප්තැම්බර් 15 දිනැති අංක පීඩී 58(2) දරන චක්‍රලේඛය. | සභාපතිවරයාගේ පෞද්ගලික ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙසද සේවය කිරීම වෙනුවෙන් අතිරේක ගෙවීමක් කළ නොහැකි වුවද, එක් වතාවකට රු. 2,500 බැගින් සමාලෝචිත වර්ෂයේදී රු. 25,000 ක්ද, 2011 වර්ෂයේදී රු.15,000 කද වශයෙන් අතිරේක දීමනා ගෙවා තිබුණි. |
| (ඇ) | 2000 ජනවාරි 31 දිනැති අංක ජ්එෆ/පීර්/6 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | සමාලෝචිත වර්ෂයට අදාලව නලධාරීන් විසින් ගෙවිය යතු උපයන විට ගෙවීම් බදු රු. 724,474 ක් සංස්ථාව විසින් ගෙවා තිබුණි. |
| (ඈ) | ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කළ රාජ්‍ය ආයතනවල නීතිමය කටයුතුවලට අදාළ 1990 පෙබරවාරි 19 දිනැති ලිපිය. | නීතිපතිවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව පෞද්ගලික නීතිඥවරුන්ගේ සේවාවන් ලබා ගැනීම වෙනුවෙන් සමාලොචිත වර්ෂය තුළද සංස්ථාව විසින් රු.130,000ක් ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය බදුවලට පෙර රු. 117,136,719 ක ශුද්ධ ලාභයක් වූ අතර, එය ඉකුත් වර්ෂය සඳහා බදුවලට පෙර ශුද්ධ ලාභය වු රු.241,118,693 සමඟ සැසඳීමේ දී මූල්‍ය ප්‍රතිඵලයේ රු. 123,981,974 ක අඩුවීමක් පෙන්නුම් කරය. තවද, භාණ්ඩාගාර බිල්පත් මත ලැබුණු රු. 31,843,823 ක පොලී ආදායම ද ඇතුළුව රු. 34,251,670 ක් වූ මෙහෙයුම් නොවන ආදායම ගණන් ගැනිමට පෙර සමාලෝචිත වර්ෂයේ දී සංස්ථාව රු. 82,885,049 ක ශුද්ධ ලාභයක් ලබා තිබුණි. ඉකුත් වර්ෂය සඳහා මෙහෙයුම් නොවන ආදායම වූ රු. 24,961,712ක් ගණන් ගැනිමට පෙර ශුද්ධ ලාභය රු. 216,156,981 ක් විය.මේ අනුව මෙහෙයුම් නොවන ආදායම ගණන් ගැනමට පෙර ශුද්ධ ලාභය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී රු.133,271,932 ක එනම් සයයට 62 ක අඩුවීමක් පෙන්නුම් කරය. සමාලෝචිත වර්ෂයේදී නිෂ්පාදන පිරිවැය වැඩිවිම සහ විකුණුම් හා බෙදා හැරීමේ වියදම් සැලකියයුතු ලෙස වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ මෙම අඩුවීමට හේතුවී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලොචනය.

සමාලෝචිත වර්ෂයේ වත්කම් කළමනාකරණයේ කාර්ය සාධනය විශ්ලේෂණකර පහතින් දක්වා ඇත.

(අ) ලාභදායිත්ව අනුපාත

| | | වර්ෂය 2012 | 2011 |
|---|---|---|---|
| දළ ලාභ අනුපාතය | සයයට | 13.7 | 21.0 |
| ශුද්ධ ලාභ අනුපාතය | සයයට | 7.0 | 15.7 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

ඉකුත් වර්ෂයේ දළ ලාභ හා ශුද්ධ ලාභ අනුපාතවලට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභ හා ශුද්ධ ලාභ අනුපාතවල අඩුවීමක් තබුණ.

(ආ) ද්‍රවශීලතා අනුපාත

| | වර්ෂය 2012 | 2011 |
|---|---|---|
| ජංගම අනුපාතය | 15.2 | 13.6 |
| ක්ෂණික අනුපාතය | 6.8 | 7.2 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සම්මත අනුපාතයන්ට වඩා ඉතා ඉහළ ද්‍රවශීල අනුපාත පැවතීම තුළ අතිරික්ත කාරක ප්‍රාග්ධනය ඵලදායි ලෙස යොදා ගෙන නොතිබුණු බව පෙනයය.

(ඇ)

| මෙහෙයුම් අනුපාත | 2012 | 2011 |
|---|---|---|
| තොග පිරිවැටුම් අනුපාතය | 10 | 32.2 |
| තොග පිරිවැටුම් කාලය - දින | 37 | 11 |
| ණයගැති පිරිවැටුම | 5.2 | 7.9 |
| ණයගැති පිරිවැටුම් කාලය - දින | 70 | 46 |
| ණය හිමි පිරිවැටුම | 15.3 | 20.1 |
| ණයහිමි පිරිවැටුම් කාලය - දින | 24 | 18 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ තොග පිරිවැටුම් අනුපාතයේ පරිහම 22.2 ක වූ අතර තොග පිරිවැටුම් කාලය දින 26 කින් වැඩිවී තිබුණි. මේ අනුව මනා කළමනාකරණයකින් තොග පවත්වා ගෙන නොතිබුණි.

(ii) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ණයගැති පිරිවැටුම් අනුපාතයෙ පරිහම 2.7ක් වූ අතර ණය එකතු කිරීමේ කාලය දින 24 කින් වැඩිවී තිබුණි. මේ අනුව ණය අයකර ගැනීම මනා කළමනාකරණයකින් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(iii) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ණයහිමි පිරිවැටුම් අනුපාතයේ පරිහම 4.8 ක්වූ අතර ණය ගෙවීමේ කාලය දින 06කින් වැඩිවී තිබුණි. මේ අනුව ණය ගෙවීම මනා කළමනාකරණයකින් පවත්වාගෙන ගොස් නොතිබුණි

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

#### (අ) නිෂ්පාදන කටයුතු

සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04ක් තුළද නිපදව ඖෂධ වර්ග සම්බන්ධ සන්සන්දනාත්මක තොරතුරු පහත පරිදි විය.

| වර්ෂය | නිෂ්පාදිත ඖෂධ වර්ග ගණන | නිෂ්පාදනය |
|---|---|---|
| | | ඒකක මිලියන |
| 2008 | 39 | 1032.6 |
| 2009 | 38 | 1195.2 |
| 2010 | 38 | 1614.1 |
| 2011 | 37 | 1796.4 |
| 2012 | 40 | 1920.2 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඖෂධ ඒකක නිෂ්පාදනයේ වර්ධන අනුපාතය 2011 වර්ෂයේදී සියයට 11.3 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ එය සියයට 7 ක් වූ බැවින් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී වර්ධන අනුපාතය සියයට 4.3 ක අඩුවීමක් පෙන්නුම් කරයි.

(ii) 2011 වර්ෂයේ නිෂ්පාදිත ඖෂධ වර්ග 37 හි එකතු නිෂ්පාදිත ඒකක මිලියන 1796.4 සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ එම ඖෂධ වර්ග 37හි එකතු නිෂ්පාදිතය ඒකක මිලියන 1755.1ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයේ නිපදවූ ඖෂධයන්ට අදාලව ඒකක මිලියන 41.3 කින් සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදනය අඩුවී තිබුණි.

(iii) 2011 වර්ෂය තුළ ඖෂධ වර්ග 37 ක් නිෂ්පාදනය කර තිබු අතර සමාලෝචිත වර්ෂයේදී එම නිෂ්පාදන වර්ග සංඛ්‍යාව 40 දක්වා වර්ධනය වී තිබණි. නමුත් එයින් ඖෂධ වර්ග 02 ක් ඉකුත් වර්ෂයෙහි නිෂ්පාදනය නතර කළ ඖෂධයන් වූ අතර ඉන් එක් ඖෂධයක් පමණක් නව නිෂ්පාදනයක් විය. නව නිෂ්පාදිත ඖෂධය සමාලෝචිත වර්ෂයේදී ඒකක මිලියන 1.5 ක් නිෂ්පාදනය කර තිබුණි. තවද එහි මූලික පර්යේෂණ කටයුතු 2006 වර්ෂයේ ආරම්භ කර තිබූ අතර එය වෙළඳපොලට ඉදිරිපත් කිරීමට වසර 06 ක ගතවී තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදිත ඖෂධ වර්ග 40න් ඖෂධ වර්ග 5 ක මුලු නිෂ්පාදනය සඳහා වන දායකත්වය සයයට 0.4 ක් පමණක් වූ අතර මුළු නිෂ්පාදනයෙන් ඒකක මිලියන 1057.05 ක් එනම් සයයට 54.99 ක් ඖෂධ වර්ග හතක් මත තීරණය වී තිබුණි.

(v) 2005 වර්ෂයේ සිට 2013 අප්‍රේල් දක්වා කාල පරිච්ඡේදය තුළදී පර්යේෂණ මට්ටමේ පැවති ඖෂධ අයිතම සංඛ්‍යාව 10 ක් වූ අතර එම පර්යේෂණ කටයුතු සඳහා වර්ෂ 02 සිට වර්ෂ 07 දක්වා කාලයක් වැයකර තිබුණ. රසායනාගාර පහසුකම් ප්‍රමාණවත් නොවීම, අවශ්‍ය පුහුණු කාර්ය මණ්ඩලය නොමැතිවීම සහ විධිමත් පුහුණුවක් අදාළ කාර්ය මණඩලයට නොලැබීම මෙම ප්‍රමාදයන්ට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ආ) ඖෂධ නිෂ්පාදනය සඳහා යන්ත්‍ර භාවිතය

---

ඖෂධ නිෂ්පාදන කාර්ය සඳහා සංස්ථාව විසින් නිෂ්පාදන යන්ත්‍ර 11 ක් සමාලෝචිත වර්ෂය තුළද භාවිතයට ගෙන තිබූ අතර G.K.F 800 දරන යන්ත්‍රය සමාලෝචිත වර්ෂයේ මාර්තු, මැයි, අගෝස්තු සහ දෙසැම්බර් යන මාසයන් තුළදී නිෂ්පාදනය සඳහා යොදාගෙන නොතිබුණ. සමාලෝචිත වර්ෂය තුළදී එම යන්ත්‍රය මඟින් Indometacin Cap BP 25 mg හා Chloramphenicol Cap BP 250 mg යන ඖෂධ වර්ග 2 ක පමණක් නිපදවා තිබූ අතර වර්ෂය අවසානයේදී පිළිවෙලින් ඉහත ඖෂධ වලින් ඒකක මිලියන 7.78 ක් සහ ඒකක මිලියන 11.18 ක් සැපයිමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

(ඇ) අලෙවි කටයුතු හා මිල කිරීම

---

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ සංස්ථාවේ පෙති සහ කරල් අලෙවියට අදාළ තොරතුරු පහත පරිදි විය.

| අලෙවිය | ඖෂධ අලෙවිය | | අලෙවි වටිනාකම | |
|---|---|---|---|---|
| | 2012 | 2011 | 2012 | 2011 |
| | ඒකක මිලියන | ඒකක මිලියන | රු. මිලියන | රු. මිලියන |
| රාජ්‍ය ඖෂධ සංස්ථාවට | 492.4 | 546.7 | 412.4 | 424.0 |
| සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකට | 1,203.9 | 1,244.3 | 1,000.7 | 1,006.8 |
| අපනයන | 3.8 | --- | 1.4 | --- |
| වෙනත් | --- | 1.4 | --- | 0.8 |
| | 1,700.1 | 1,792.4 | 1,414.5 | 1,431.6 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුළද රාජ්‍ය ඖෂධ සංස්ථාව හා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත අලෙවි කර තිබුණු ඖෂධ ඒකක ප්‍රමාණය හා එහි අලෙවි වටිනාකම මුළු අලෙවියෙන් සයයට 99.8 ක් පමණ විය.එසේ වුවද ඉකුත් වසර හා සැසඳීමේ දී රාජ්‍ය ඖෂධ සංස්ථාව හා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත අලෙවිය කළ ඖෂධ ඒකක ප්‍රමාණය පිළිවෙලින් සයයට 9.9 කින් හා සයයට 3.2 කින් අඩුවී තිබුණි. සමස්ථයක් ලෙස ඉකුත් වසරට සාපේක්ෂව මුළු අලෙවි වටිනාකම සයයට 1.1 කින් අඩුවී තිබූ අතර එහි මූල්‍යමය වටිනාකම රු. මිලියන 17.1ක් විය.

(ii) සමාලෝචිත වර්ෂය තුළ Diethlcarabamazine tab 50mg ඖෂධයෙන් ඒකක මිලියන 3.8 ක් නිෂ්පාදනය කර රු.මිලියන 1.4 කට අපනයනය කර තිබුණි.

(iii) ඖෂධ අලෙවිය පිළිබඳ සැලකීමේදී මුළු ඖෂධ ඒකක අලෙවියෙන් සයයට 53 ක් ඖෂධ වර්ග 6ක් මත රැඳී තිබුණි.

(iv) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව ඇණවුම් කළ ඖෂධ වර්ග වලින් පිළිවෙලින් ඒකක මිලියන 389.4ක් හා ඒකක මිලියන 193.61ක් සමාලෝචිත වර්ෂය අවසානයට සැපයීමට ඉතිරිව තිබණි. 2011 වසර තුළ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල්ට සැපයිය යුතු ඖෂධ වර්ග 07 ක ඒකක මිලියන100.5ක් හා 2012 වර්ෂයේ දෙවන හා තෙවන කාර්තු තුළ සැපයිය යුතු ඖෂධ වර්ග 06 ක ඒකක මිලියන 62.9ක් මෙහි ඇතුළත්ව තිබුණි.

(v) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල්ට ඖෂධ අලෙවි කිරීමේදී ප්‍රමිත නිෂ්පාදන පිරිවැය මත සයයට 12 ක ලාභාන්තකයක් එකතු කර මිල නියම කරනු ලැබේ. එසේ වුවද මුළු ප්‍රමිත නිෂ්පාදන පිරිවැයට ඇතුළත් පිරිවැය මූලිකාංග මොනවාද යන්න හඳුනා නොගෙන ඊට අදාළ නොවන පිරිවැය මූලිකාංගද ඇතුළත් කර ප්‍රමිත පිරිවැය ගණනය කර තිබුණි. උදාහරණ ලෙස හානි හා භාවිතයට නොගත් ද්‍රව්‍ය පිරිවැය පමිත පිරිවැය ගණනය සඳහා අදාළ කරගෙන තිබුණි.

(vi) මුළු ප්‍රමිත පිරිවැයට සයයට 12 ක ලාභාන්තිකයක් එකතු කර මිල නියම කළ යුතු වුවද ඇතැම් ඖෂධ වර්ගවල ලාභ ආන්තිකය සයයට 13 සිට සයයට 20 දක්වා පරාසයක විය. මිල කිරීමේදී අනුමත ලාභාන්තිකය යොදා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගණනය කරන ලද ලාභය නිවැරදි නොවීය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
----------------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඖෂධ නිෂ්පාදනයට මිලදීගෙන තිබූ පිරිවැය රු. 8,137,215 ක් වටිනා අමුද්‍රව්‍ය අයිතමයන් 6 ක් නිෂ්පාදනයට යොදා ගෙන නොතිබණි.

විස්තර පහත දැක්වේ.

| අයිතමය | ප්‍රමාණය | වටිනාකම |
|---|---|---|
| | | රු. |
| E/H Gelatin capsules | ඒකක මිලියන 35.56 | 5,656,285 |
| Malaic Acid BP 2010 | කිලෝග්‍රෑම් 84 | 115,572 |
| Sodium starch Glycalate BP 2010 | කිලෝග්‍රෑම් 2000 | 771,080 |
| Aspirin | කිලෝග්‍රෑම් 1100 | 1,017,053 |
| Ferric oxide Red | කිලෝග්‍රෑම් 8.84 | 17,939 |
| Bisacodyl BP | කිලෝග්‍රෑම් 55.5 | 559,286 |
| | | 8,137,215 |

ඖෂධ නිෂ්පාදනයට මිලදීගෙන තිබුණු ඉහත විස්තර දැක්වෙන අමුද්‍රව්‍ය වර්ග 06න් පිරිවැය රු. 5,656,285ක් වූ E/H Gelatin capsules අමුද්‍රව්‍යය යන්ත්‍ර මගින් ප්‍රතික්ෂේප වීම නිසාද, පිරිවැය රු.1,576,339ක් වූ Aspirin හා Bisacodyl BP යන අමුද්‍රව්‍යයන් වට්ටෝරුවෙහි දෝෂයන් පැවතීම නිසාද, පිරිවැය රු.904,591 ක්වූ අමුද්‍රව්‍යයන් පිරිවිතරයන්ට අනුකූල නොවීම, වර්ණය වෙනස්වීම හා කල් ඉකුත්වීම යන හේතූන් නිසාද නිෂ්පාදනයට යොදාගත නොහැකිවී තිබුණි.

පිරිවිතර වලට අනුකූල වූ නමුදු යන්ත්‍ර මගින් ප්‍රතික්ෂේප වීම නිසාද, **Malaic Acid BP 2010** පෙති නිෂ්පාදනය සඳහා කුඩා ප්‍රමාණයක් නිකුත් කිරීම නිසා ජලවාෂ්ප හා වාතය උරා ගැනීම නිසා හානිවීමද, **Asprin** හා **Bisacodyl BP** වට්ටෝරුවේ පැවති සංවර්ධිත ක්‍රියාවලීන් අඛණ්ඩව සිදුකෙරෙමින් පවතින නිසාද, **Feric Oxide Red** කල් ඉකුත් වීම නිසාද, හානියට පත්ව ඇති අතර **Sodium Starch Glycolate** සම්බන්ධයෙන් වූ පිරිවැය සැපයුම්කරුගෙන් අයකර ගැනීමට පියවර ගනිමින් සිටින බවද සභාපතිවරයා විසින් දන්වා තබුණ.

(ආ) පෙති නිෂ්පාදන යන්ත්‍රයක් මිලදී ගැනිම.

------------------------------------------

පෙති නිෂ්පාදන යන්ත්‍රයක් මිලදී ගැනිම සඳහා 2011 මාර්තු 29 දින ටෙන්ඩර් කැඳවා තිබුණු අතර රු.91,026,700 කවු වැට් සහිත තෙවන අවම මිල ඉදිරිපත් කළ සැපයුම්කරු අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරා ගෙන තිබුණ. ඒ සඳහා අත්තිකාරම් වශයෙන් රු. 23,337,876 ක් 2012 ජූලි 16 දින සැපයුම්කරුගේ දේශීය නියෝජිතයාට ගෙවා තිබුණි.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(i) ගිවිසුම අනුව යන්ත්‍රය 2012 නොවැම්බර් මාසයේද සැපයිය යුතුව තිබුණ නමුත්, කොන්ත්‍රාත්කරුගේ ඉල්ලම මත, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් 2013 මැයි 30 දින දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝකර තිබුණි. මෙම දිනටද සැපයුම්කරු විසින් යන්ත්‍රය සැපයීමට අපොහොසත්වීම නිසා ඒ වන විට ගෙවා තබුණු රු. 23,337,876 ක අත්තිකාරම් මුදල , කාර්යසාධන ඇපකරයෙන් 2013 අප්‍රේල් 23 දින අයකර ගෙන තිබුණද, 2013 ජුනි 13 දින නැවතත් මෙම අත්තිකාරම් මුදලට සමාන මුදලක් එනම් රු.23,337,876 ක අත්තිකාරම් ලෙස සැපයුම්කරුට ගෙවා තිබුණි. එසේ වුවද, 2013 ඔක්තෝබර් 15 දින වන විටත් මෙම යන්ත්‍රය සැපයුම්කරු විසින් සපයා නොතිබුණි.

(ii) මේ අනුව, අත්තිකාරම් මුදල ගෙවූ 2012 ජුලි 16 දින සිට එය ආපසු අයකරගත් 2013 අප්‍රේල් 23 දින දක්වා රු. මිලියන 23.34 ක මුදලට අදාළ පොළිය දළ වශයෙන් රු. මිලියන 2.28ක් අයකර ගැනීමට 2013 ඔක්තෝබර්15 දින දක්වා කටයුතු කර නොතිබුණ.

(ඇ) සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේ රු.81,780,582ක් වූ බදු වලට පසු ලාභය මත ගෙවිය යුතු රු. 20,445,145 ක ලාභාංශ (deemed dividend) වෙනුවට රු. 20,000,000 ක් ලාභාංශ ලෙස ගෙවා තිබුණ. සංස්ථාව විසින් ලාභාංශ (deemed dividend) රු. 445,145ක් අඩුවෙන් ගෙවීමේ ප්‍රතිඵලයක්

ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අඩුවෙන් ගෙවන ලද ලාභාංශ (deemed dividend) මත රඳවාගත් ලාභාංශ බදු (deemed dividend Tax) අයකිරීමේ අවදානමක් පවතී.

3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 පෙබරවාරි 22 දිනැති අංක BP/18/13 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව පිරිවැය රු.938,056 ක්වූ හානිවූ ඇසුරුම් ද්‍රව්‍ය හා රු.172,394 ක්වූ හානි වූ අමුද්‍රව්‍ය එකතුව රු.1,110,450 ක් සමාලෝචිත වර්ෂයේදී ලාභයට එරෙහිව ලියාහැර තිබුණි.

(ආ) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, සංස්ථාවේ නිෂ්පාදිත ඖෂධ මිලදී ගැනීමේ පධාන ගැනුම්කරුවන් වුවද, සංස්ථාව විකුණුම් ප්‍රවර්ධන වියදම් ලෙස රු. 11,111,731ක් වැය කර තිබුණ. ඉන් රු. 5,969,053 ක් ගුවන් විදුලි හා පවත්පත් දැන්වීම් සඳහා වැය කර තිබුණි. තවද, 2011 වර්ෂයේ වියදමට වඩා රු. 4,875, 379 ක් විකුණුම් ප්‍රවර්ධන වියදම් ලෙස වැය කර තිබුණද සමාලෝචිත වර්ෂයේ විකුණුම් ඉකුත් වර්ෂයේ විකුණුම් සමඟ සැසඳීමේදී එය රු.17,108,468 කින් අඩුවී තිබුණි. මේ අනුව විකුණුම් ප්‍රවර්ධන වියදම් ලෙස දරන ලද පිරිවැය ඵලදායි ලෙස යොදා ගෙන නොතිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

3.4.1 <u>නිෂ්පාදන ඇසුරුම් හා ගබඩා පහසුකම් සඳහා වූ ගොඩනැගිල්ල ඉදිකිරීම</u>

2009 වර්ෂයේදී විවෘත ටෙන්ඩර් කැඳවීම මගින් වැට් රහිත අවම මිල රු. 72,152,252 ක ඉදිරිපත් කර තබුණු කොන්ත්‍රාත්කරුට ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

(අ) කොන්ත්‍රාත් ගිවිසුමට අනුව, ඉදිකිරීම් වැඩ 2010 අගෝස්තු 08 දින නිමකළ යුතුව තබුණද, 2013 ඔක්තෝබර් 15 දින වන විටත් ඉදිකිරීම් නිමකර සංස්ථාවට භාරද නොතබුණ අතර, ඒ සඳහා වූ ප්‍රමාද ගාස්තු රු.8,081,052 ක අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කර කොන්ත්‍රාත්කරු තෝරාගැනමෙන් පසුව, කොන්ත්‍රාත් මිල මත ගණනය කරන ලද සයයට 6 ක සහභාගිත්ව ගාස්තුවක් ගෙවීමට එකඟ වෙමින් ඒ සඳහා කොන්ත්‍රාත් මිලට රු. 2,061,000 ක් එකතු කල වටිනාකම මත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තබුණ. උපදේශක ඉංජිනේරු ලෙස රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට සයයට 6 ක උපදේශක ගාස්තුවක් ගෙවීමට ගිවිසගෙන තිබියදී කොන්ත්‍රාත්කරුට සයයට 6 ක සහභාගිත්ව ගාස්තුවක් ගෙවීමට තුඩුදුන් හේතුන් හෙළදරව් කර නොතබුණි.

## 3.4.2 කාර්යාල ගොඩනැගිල්ල සහ ගබඩා හා කාර්යාල දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම

ඉහත සඳහන් ගොඩනැගිලි දෙක ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගැනීමට ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කර නොතිබුණි. කොන්ත්‍රාත් උපදේශක සමාගම පිළියෙල කර තබුණු පිළිවෙලින් රු. 40,249,323 ක් සහ රු.8,650,538 ක්වූ වැට් සහිත ඉංජිනේරු ඇස්තමේන්ත මත ඉහත කොන්ත්‍රාත්කරුටම මෙම කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණි.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් ගිවිසුමට අනුව, කාර්යාල ගොඩනැගිල්ල 2010 සැප්තැම්බර් 06 දින නිමකර භාරදිය යුතු වුවද, 2013 ඔක්තෝබර් 15 දින වන විටත් වැඩ නිමකර භාරදී නොතබුණ අතර, ඒ සඳහා වූ ප්‍රමාද ගාස්තු රු. 4,024,932 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත් ගිවිසුමට අනුව, ගබඩා හා කාර්යාල දෙමහල් ගොඩනැගිල්ල 2012 ජනවාරි 20 දන වැඩ නිමකර භාරදිය යුතු වුවද, 2013 ඔක්තෝබර් 15 දන වන විටත් එහ වැඩ අවසන් කර නොතබුණ අතර, ඒ සඳහා වූ ප්‍රමාද ගාස්තු රු. 865,053ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණ.

(ඇ) ඉහත කොන්ත්‍රාත් දෙක සඳහා ගෙවූ බිල්පත් 05 ක එකතුව වූ රු.9,625,744 ක බිල් සහතික කිරීමට පෙර (on account) කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ඉදිරිපත්කළ කොන්ත්‍රාත් ලිපිගොනු අනුව එම ගෙවීම් කළ දිනට පෙර දින දාතම යොදා කොන්ත්‍රාත් උපදේශන ආයතනය විසින් සහතික කර තිබුණි.

## 4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලපරිච්ජේය සඳහා පිළියෙල කර තිබුණු සංයුක්ත සැලැස්මෙහි, වාර්ෂිකව සයයට 10ත් - සයයට 15 ත් අතර ප්‍රමාණයකින් ඖෂධ අලෙවිය වර්ධනය කිරීම අරමුණ වී තිබුණද, සමාලෝචිත වර්ෂයේ දී ඖෂධ අලෙවිය ඉකුත් වසරට වඩා සයයට 1.1 කන් අඩුවී තිබුණ. තවද ඉදිරි වර්ෂ 03 ක මෙහෙයුම් ප්‍රතිඵල සංයුක්ත සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

### 4.2 ක්‍රියාකාර සැලැස්ම.

සමාලෝචිත වර්ෂයට අදාළව පිළියෙල කර තිබුණු ක්‍රියාකාර සැලැස්මේ ඇතුළත් කාර්යයන් නිම කළ යුතු කාලයන් සඳහන් කර නොතිබුණි.

4.3 අයවැය පාලනය.
------------------

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ 2012 වර්ෂයට අදාළ අයවැය ලේඛනය සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මස නැවත සංශෝධනය කර තිබුණි.

අයවැයගත වියදම් ශීර්ෂ 06කට අදාළව සත්‍ය වියදම සියයට 46 සිට සියයට 1040 දක්වා හා වත්කම් සඳහා සියයට 10 සිට සියයට 3017 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලනයන්
------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලද.පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

අ) දේපල, පිරියත හා උපකරණ

ආ) ඖෂධ මිල කිරීම

ඇ) නිෂ්පාදන කටයුතු

ඈ) බදු

ඉ) අයවැය

ඊ) ඉදිකිරීම්

උ) ලැබිය යුතු දෑ

ඌ) සංයුක්ත සැලැස්ම

එ) නීතිරීති රෙගුලාසිවලට අනුකූල නොවීම.

ඒ) මානව සම්පත් කළමනාකරණය